# HSBC සමාජ මාධ්‍ය ප්‍රජා මාර්ගෝපදේශ

ඔබේ නම, ලිපිනය, උපන් දිනය, බැංකු ගිණුම් අංකය, ක්‍රෙඩිට් කාඩ්පත් අංකය වැනි කිසිදු පුද්ගලික තොරතුරක් ෆේස්බුක්, ට්විටර් සහ වෙනත් සමාජ මාධ්‍ය නාලිකා වලින් බෙදා-හදා නොගන්නා ලෙසට HSBC දැඩිව නිර්දේශ කරයි. එවැනි යම් තොරතුරක් බෙදා-හදා ගැනීමේ අවදානම ඔබ විසින් ම දැරිය යුතු වේ. සමාජ මාධ්‍ය හරහා කිසිදු පුද්ගලික තොරතුරක් බෙදා-හදා ගන්නා ලෙසට HSBC කිසිදු අවස්ථාවක ඔබෙන් ඉල්ලා සිටින්නේ නැත.

කරුණාකර, පහත දැ ප්‍රවර්ධනය වන, යෝජනා වන හෝ දිරිගැන්වෙන අන්තර්ගතයන් සමාජ මාධ්‍ය හරහා පළ නොකරන්න:

- සූදු කෙළීම හෝ ඔන්ලයින් කැසිනෝ, ඔට්ටු ඇල්ලීම්, බිංගෝ හෝ පෝකර් වැනි ඕනෑම යමක් ආශ්‍රිත අන්තර්ගතයන් කිසිවක්;
- ගිනි අවි/ආයුධ/වෙඩි බෙහෙත්, නීතිවිරෝධී මත්ද්‍රව්‍ය කිසිවක්, ගණිකා වෘත්තිය, කාමුක දර්ශන භාවිතයන් කිසිවක්;
- නිරුවත, අසභ්‍ය වචන හෝ දරුවන්ට නොගැළපෙන දෑ, ප්‍රචණ්ඩත්වය, හෝ මද්‍යසාර හෝ දුම්කොළ නිෂ්පාදන භාවිතයන් කිසිවක්;
- කිසිදු පුද්ගලයකුට, රජයට හෝ ආයතනකට එරෙහිව අවි අතට ගැනීම හෝ කිසිදු රජයක් බිඳ හෙළීමට අභියෝග කිරීමක් හෝ තැත් කිරීමක්;

නැතහොත්, පහත දැ අන්තර්ගතයන් ද පළ නොකළ යුතු වේ:

- අශිෂ්ට, අවිනීත, නිගරු කෙරෙන, අපහාසාත්මක, අපවාදාත්මක සහ/හෝ නීතිවිරෝධී අන්තර්ගතයන්;
- ප්‍රකාශන හිමිකම්, වෙළඳ ලකුණු, පෞද්ගලිකත්ව, ප්‍රචාර හෝ වෙනත් පුද්ගලික හෝ හිමිකාර අයිතීන් ඇතුළුව කිසිදු තෙවැනි පාර්ශ්වයක අයිතීන් කඩ කෙරෙන හෝ එසේ නොමැති නම් උල්ලංඝනය කෙරෙන අන්තර්ගතයන්;
- රැවටිලි සහගත හෝ වංචාකාරී අන්තර්ගතයන්;
- ජාතිය, වයස, ස්ත්‍රී-පුරුෂ භාවය, අබාධිත භාවය, ලිංගික දිශානතීන්, ජනවාර්ගිකත්වය, ආගම, දේශපාලන මතිමතාන්තර, ජාතික සම්භවය, පුරවැසි භාවය, පරම්පරාව, විවාහක අවිවාහක බව, වෘද්ධ තත්ත්වය, හෝ මානසික හෝ ශාරීරික ආබාධිත භාවය හෝ ස්වභාවය මත පදනම්ව වුව තනි පුද්ගලයකු, කණ්ඩායමක් හෝ වෙනත් වෙබ්අඩවි පරිශීලකයන් වෙත වුව

එල්ල කෙරෙන ද්වේශ සහගත, හෝ වෙනස්කොට සැලකෙන, අවමන් සහගත හෝ අපකීර්තියට පත් කෙරෙන අන්තර්ගතයන් හෝ සැලසුමක්, සේවාවක්, කර්මාන්තයක් හෝ සංවිධානයක් වෙත බලපෑම් කිරීම උදෙසා යොදා ගනු ලබන විරුද්ධවාදී හෝ ගැටුම් ඇති කෙරෙන හෝ උපායයන් යොදා ගනු ලබන අන්තර්ගතයන්;

- රහස්‍ය භාවය පිළිබඳ ඕනෑම බැඳීමක් උල්ලංඝනය කෙරෙන රහසිගත තොරතුරු;
- පරිගණකයක ක්‍රියාකාරිත්වයට ඕනෑම ආකාරයකින් හානි කිරීම සඳහා නිර්මාණය කරන ලද වෛරස, ඔත්තු-මෘදුකාංග, අනිටු-මෘදුකාංග කිසිවක් හෝ වෙනත් අනිටු සංරචක කිසිවක්; හෝ
- “අයාචිත තැපැල්” ප්‍රචාරණ දැන්වීම් හෝ HSBC-නොවන දීමනා, සැලසුම්, සේවා හෝ වෙබ්අඩවි පිළිබඳ සඳහන් කිරීම්;

සඳුදා සිට සිකුරාදා දින වල සහ, රජයේ සහ බැංකු නිවාඩු දින හැර අනෙකුත් ව්‍යාපාර දින වල පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා දක්වා කාලය තුළ HSBC Sri Lanka ෆේස්බුක් පිටුව යාවත්කාලීන කිරීම සහ නිරීක්ෂණය කිරීම අප විසින් සිදු කරනු ලබයි.

අපගේ අන්තර්ගතය ඔබ විසින් share කරන්නේ නම් සහ අප like/follow කරන්නේ නම්, ඊට කැමැත්තෙමු. නව සහ පිටු අප විසින් ස්වයංක්‍රීයවම නැවත like/follow කිරීමක් සිදු නොකරමු. අප විසින් ඔබ follow කරනු ලැබුවහොත්, HSBC වෙතින් කිසිදු ආකාරයක අනුමත කිරීමක් එයින් අදහස් නොකෙරෙයි.

සමාජ මාධ්‍ය වේදිකා මගින් HSBC වෙත සහ HSBC පිළිබඳව ජනතාව පවසන දෑ අප ඉතා සක්‍රීය ලෙස පිරික්සමින් සිටින අතර, ඔබේ ප්‍රතිචාර අගය කරමු. කෙසේ වෙතත්, එකී වේදිකාවන්ගේ පොදු ස්වාභාවය නිසාම, සියලු ගැටලු සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමේ හෝ සම්බන්ධවීමේ හෝ හැකියාවක් අපට නොමැත.

HSBC පෙනී සිටින සමාජ මාධ්‍ය හරහා ෆෙස්බුක් හෝ ට්විටර් වෙතින් සෘජු පණිවුඩ හරහා පුද්ගලික ගිණුම් තොරතුරු පිළිබඳව සාකච්ඡා කළ නොහැක. එවැනි තොරතුරු බෙදා-හදා ගැනීමේ අවශ්‍යතාව මතු වන විමසීමක් ඔබ හට තිබේ නම්, දක්වා ඇති දුරකථන අංක හරහා කරුණාකර අප හා සම්බන්ධ වන්න.